# ජපානයේ සුපිරි තාක්ෂණය සමග Sterling Aftercare වෙතින් සියලු ජපන් වාහන සඳහා සුපිරි අලුත්වැඩියාවක්









**දශකයකට ආසන්න කාලයක් පුරා වාහන සේවා සැපයුම් ක්ෂේත්‍රය හා බැඳී කීර්තිමත් නාමයක් ලෙස ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගම හැඳින්විය හැක.**

ජපන් වාහන සඳහා ප්‍රථම වරට **Sterling Aftercare Guarantee** වගකීම් සහතිකය පිරිනැමූ ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගම ඉන් නොනැවතී **Sterling Aftercare** වගකීම් සහතිකය ලත් සියලුම වාහන හිමිකරුවන් සඳහා අලෙවියෙන් පසු සුවිශේෂී ප්‍රතිලාභ හිමිකර දෙන්නට ක්‍රියා කරයි. එමෙන්ම ඔවුන්ගේ නවීන තාක්ෂණයෙන් අනූන සේවා මධ්‍යස්ථාන වලදී අනෙකුත් ඕනෑම වාහන හිමියෙක් සඳහා සේවා ලබා ගැනීමේ පහසුකම්ද සලසා ඇත. ඒ සඳහා ස්ථාපිතව පවතින **Sterling Aftercare** සේවා මධ්‍යස්ථාන සහ ඒවායෙන් ලබාදෙන විශේෂිත සේවාවන් පිළිබඳව උඩහමුල්ල -නුගේගොඩ **Sterling Aftercare Centre** හි නියෝජිතයෙක් සමඟ කළ සාකච්ඡාවක් පහතින් දිග හැරේ.

**Sterling Aftercare මධ්‍යස්ථාන ඔස්සේ සලසන සේවාවන් පිළිබඳ සඳහන් කළොත්...**

**Sterling Aftercare** මධ්‍යස්ථාන මහර- කඩවත, උඩහමුල්ල - නුගේගොඩ, දූනගහ-මිනුවන්ගොඩ, නාරාහේන්පිට සහ ගාල්ල යන ප්‍රදේශයන්හි ස්ථාපිත කර තිබෙනවා. **Sterling Aftercare** ප්‍රධාන මධ්‍යස්ථානය උඩහමුල්ල-නුගේගොඩ පිහිටා තිබෙනවා. එම සියලු මධ්‍යස්ථානවලදී සේවා සපයන්නේ **Sterling Aftercare Guarantee** වගකීම් සහතිකය ලද වාහන හිමියන්ට පමණක් නොවේ. සියලුම වාහන හිමියන්ට අවශ්‍ය පූර්ණ සේවා, කාර්මික අලුත්වැඩියාවන් සිදු කර ගැනීමට සහ වාහන අමතර කොටස්, ඔයිල් වර්ග මිලදී ගැනීමට පුළුවන්.

ඔබේ ජපන් වාහනයේ පූර්ණ සේවාවන් සහ සියලුම කාර්මික අලුත්වැඩියාවන් උඩහමුල්ල අපගේ ප්‍රධාන ශාඛාවෙන් ලබා ගන්නට පුළුවන්. ඔයිල් වර්ග මාරු කිරීම සහ අමතර උපාංග සඳහාම විශේෂිත වූ **Sterling Aftercare** මධ්‍යස්ථානයක් නාරාහේන්පිට පිහිටුවා තිබෙනවා. ඕනෑම ජපන් වාහනයකට අවශ්‍ය අමතර කොටස් ඉන් මිලදී ගන්නට පුළුවන්. අපගේ නාරාහේන්පිට ශාඛාව මගින් මිලදී ගත් වාහන අමතර කොටස් සවි කිරීම සහ ඔයිල් මාරුකිරීමත් සිදු කරනවා. ඒ මොහොතේ අප ළඟ නොමැති වාහන අමතර කොටස් හෝ උපාංග යම්කිසි කාලසීමාවක් තුළදී ජපානයෙන් ආනයනය කර සේවා දායකයන්ට සපයා දෙනවා.






අපගේ ගාල්ල ශාඛාව ඔස්සේ වාහන පිළිබඳ පූර්ණ සේවාවන් සහ සියලුම කාර්මික අලුත්වැඩියා කටයුතු සිදු කර ගැනීමට පුළුවන්. මහර- කඩවත **Sterling Aftercare** මධ්‍යස්ථානය අපගේ පළමු ශාඛාවයි. ඒ ඔස්සේත් වාහන පිළිබඳ පූර්ණ සේවාවන් සහ සියලුම කාර්මික අලුත්වැඩියාවන් සිදු කරනවා.

**Sterling Aftercare** සෑම මධ්‍යස්ථානයක් ඔස්සේම පරිසර හිතකාමී බවින් යුත් ගුණාත්මක සේවයක් පාරිභෝගික ඔබට සැලසීමට අප පියවර ගන්නවා. අපගේ සියලුම ශාඛාවලට ISO - 9001 නිෂ්පාදන තත්ත්ව සහතිකය සහ ISO - 14001 පරිසර තත්ත්ව සහතිකය ලැබී තිබෙනවා.

**දූනගහ - මිනුවන්ගොඩ පිහිටි Sterling Auto City මධ්‍යස්ථානය වාහන සම්බන්ධයෙන් සුවිශේෂී සේවා සපයනවා නේද?**

ඔව්. දූනගහ - මිනුවන්ගොඩ පිහිටි **Sterling Auto City** මධ්‍යස්ථානය වාහන සම්බන්ධ සේවා සැපයීමට අමතරව විශේෂයෙන්ම රථවාහන අනතුරු නිසා හානි වූ වාහන බඳ ඇතුළු උපාංග නියමිත ප්‍රමිතියටම අලුත්වැඩියා කිරීම සිදු කරනවා. නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් Sterling Auto City මධ්‍යස්ථානයේදී ඇදවීමට ලක් වූ වාහන බඳ කොටස් පෙර පැවති තත්ත්වයටම පත් කිරීමේ හැකියාව පවතිනවා. ඒ සඳහාම විශේෂිත වූ නවීන යන්ත්‍රෝපකරණ අප සතුව තිබෙනවා. **Car-O-Liner** යන්ත්‍රය ඊට හොඳම උදාහරණයයි. යන්ත්‍රානුසාරයෙන්ම වාහනයේ ඇද වූ බඳ කොටස් සැකසීමට හැකි වීම එහි විශේෂත්වයයි. ඒ වගේම දූනගහ **Sterling Auto City** මධ්‍යස්ථායේ නියම ප්‍රමිතියෙන් යුත් **automobile** තීන්ත වර්ගත් වාහන සඳහා අපි භාවිත කරනවා.

**අනෙකුත් වාහන සඳහා පවතින සේවා මධ්‍යස්ථාන හා සසඳන විට Sterling Aftercare Centre හි විශේෂත්වයන් මොනවාද?**

**Sterling Aftercare Centre** අපගේ වගකීම වන්නේ පාරිභෝගිකයින්ගේ වටිනා වාහනයට අවශ්‍ය සේවාවන් ගුණාත්මක අයුරින් පිරිනැමීමයි. **Sterling Aftercare Centre** හිදී ක්‍රමානුකූල සැලසුම් සහගත බවකින් යුතුව ඔබේ වාහනයට අවශ්‍ය සේවාව ලබා දීමට කටයුතු කරනවා. **Sterling Aftercare** වගකීම් සහතිකය ලැබූ හෝ නොලැබූ ඕනෑම වාහනයක් **Service** කිරීමට හෝ අලුත්වැඩියා කටයුත්තක් සඳහා අප මධ්‍යස්ථාන කරා රැගෙන යාමට බලාපොරොත්තුවනවා නම් පාරිභෝගිකයන් පළමුව සිදු කළ යුත්තේ **0117 600 800** ඔස්සේ අපගේ පාරිභෝගික සේවා කණ්ඩායම අමතා වාහනය අප පද්ධතියෙහි ලියාපදිංචි කිරීමයි. එහිදී ඔබට පැමිණීමට පහසු අපගේ සේවා මධ්‍යස්ථානය සඳහන් කර එහි වෙන් කර ගැනීමක් සිදු කළ යුතුයි.

හදිසියේ වාහනයේ ක්‍රියාකාරීත්වය අඩපණ වූ විටකදී පැය 24පුරා ක්‍රියාත්මක **Roadside Assistance Service** ඇමතීමෙන් ඔබට අවශ්‍ය උපදෙස් හෝ සේවා ලබා ගත හැකියි.

අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පිවිසෙන පාරිභෝගිකයන් සඳහා සේවා උපදේශකවරුන් **(Service Advisers)** ඔස්සේ වාහනයට හිතකර සහ අහිතකර තත්ත්ව, වාහනයේ අමතර උපාංග, වාහනයේ නඩත්තුව, වාහන හිමිකරුවෙක් ලෙස ඔබ දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අප කටයුතු සම්පාදනය කර තිබෙනවා. මෙහි පවතින විශේෂත්වය වන්නේ ඔබගේ වාහනය අපගේ සේවා ස්ථානයට ඇතුළත් කළ අවස්ථාවේ පටන් ඔබේ වාහනය සඳහාම විශේෂ වූ සේවා උපදේශකවරයෙක් වෙන්ව කටයුතු කිරීමයි.

**Sterling Aftercare ඕනෑම මධ්‍යස්ථානයකට පිවිසෙන පාරිභෝගිකයින්ගේ සුවපහසුව සඳහා සලසන සේවාවන් පිළිබඳව සඳහන් කරනවා නම්....,**

සාමාන්‍යයෙන් වාහනයක පූර්ණ සේවා කටයුත්තක් සඳහා පැය 4 - 5 ක කාලයක් සේවා මධ්‍යස්ථානය තුළ ගෙවා දැමීමට පාරිභෝගිකයාට සිදු වෙනවා. එහිදී පාරිභෝගිකයාට අවශ්‍ය සියලු පහසුකම්වලින් සමන්විත **Customer Lobby** අපගේ සෑම සේවා මධ්‍යස්ථානයකම ඉදිකර තිබෙනවා. එහිදී අන්තර්ජාල පහසුකම්, රූපවාහිනී නැරඹීමේ හැකියාව, තේ, කෝපි වැනි පාන ලබා ගැනීමේ හැකියාව වැනි පහසුකම් අප සපයා තිබෙනවා. වඩාත් තෘප්තිමත් පාරිභෝගික සේවාවක් ලබා දීමේ අරමුණින් මේ දිනවල අපගේ මධ්‍යස්ථානවලදS **Spot Survey**සිදු කරනවා. එහිදී පාරිභෝගිකයන්ගෙන් ලබා ගන්නා අදහස් අනුව තවදුරටත් අපගේ සේවාවන් සහ පහසුකම් වර්ධනය කරන්නට පියවර ගන්නවා.

**Sterling Aftercare Centre හි තාක්ෂණය පිළිබඳව සඳහන් කළොත්,**

අප සමාගම සතු තාක්ෂණය පිළිබඳ සඳහන් කරනවා නම් දැනට ලංකාවේ වාහන Service කිරීම හා අලුත්වැඩියාව සම්බන්ධ නවීනතම තාක්ෂණය සහ ඊට අවශ්‍ය හොඳම අමුද්‍රව්‍ය, උපාංග අප සතුයි. **Sterling Aftercare** මධ්‍යස්ථානවල සේවයේ නියුතු සියලු තාක්ෂණික සහ කාර්මික ශිල්පීන් ජපන් තාක්ෂණික දැනුමින් සන්නද්ධයි. විශේෂයෙන්ම ඔවුන් ඒ සම්බන්ධ දැනුමෙන්, පළපුරුද්දෙන් සහ නිරන්තරයෙන් යාවත්කාලීන වන වාහන පිළිබඳ තාක්ෂණික දැනුමෙන් සමන්විතයි. ජපන් තාක්ෂණික විශේෂඥයින්ගේ **(Japanese Technical Experts)** සහය නිරතුරුව අප සමාගම ලබා ගන්නේ පාරිභෝගිකයින්ට ගුණාත්මක, නවීන සහ යාවත්කාලීන වූ තාක්ෂණික සේවාවක් පිරිනැමීමේ අරමුණින්.

යුරෝපීය මාදිලියේ වාහන සඳහා පූර්ණ සේවා සහ කාර්මික අලුත්වැඩියාවන් සැපයීම අප මේ වන විටත් හඳුන්වා දී තිබෙනවා. යුරෝපීය වාහන ආශ්‍රිත සේවා ලබා ගැනීමට අපේක්ෂා කරන වාහන හිමියන්ට එය අලුත් ආරංචියක් වේවි. ඒ වගේම අපගේ ශාඛා ජාලය තවතවත් පුළුල් කිරීමටත් ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

Sterling Aftercare සේවාවන් සහ අලුත්වැඩියාව සම්බන්ධව සියලු තොරතුරු 0117 600 800 යන අපගේ පාරිභෝගික සේවා දුරකථන අංකය ඇමතීමෙන් ලබා ගත හැක.

■ **හෂිනි ඉරේෂා ගුණවර්ධන**


සැබෑ වගකීම් සහතිකයක ප්‍රතිලාභ

STERLING AFTER CARE GUARANTEE
THIS VEHICLE IS GUARANTEED WITH AFTER SALES CARE BY STERLING JAPAN
Visit www.sterling-japan.com for conditions
Assurance to drive with confidence.

ඔබගේ මෝටර් රථයේ සියලුම නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සඳහා ජපන් තාක්ෂණයෙන් අනූන වූ සේවා මධ්‍යස්ථාන පහක්.



මහර



දූනගහ



නාරාහේන්පිට



ගාල්ල



උඩහමුල්ල



වැඩි විස්තර සඳහා 0117 600 800 අමතන්න.